දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවක් සමගින්, හදිසි උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය වන්නේ යැයි මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන් තුළ දැක්වෙන්නේ, එසේ හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුක්ත තවත් අයෙකුගේ දිවි ගලවා ගැනීමට ඉඩකඩක් ලැබීමේ හැකියාව නිසායි.

දිවි තොර කරගැනීම් වාර්තාකරණයන් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ නිත්‍ය භාවිතාවක් විය යුතු යැයි Ethics Eye විසින් නැවත නැවතත් අවධාරණය කර ඇත්තේද ඒ හේතුවෙනි.

ලෝක දිවි තොර කරගැනීම් වැළැක්වීමේ දිනය සඳහා ලිපියක් පළ කරන The Morning පුවත්පත (09/09), තම ලිපිය සමගින් හදිසි උපකාරක අංක පෙළක්ද පළ කරයි. එයට පාඨක අප සැමගේ ප්‍රශංසාව හිමි විය යුතු වෙයි.

මේ අයුරින් දිවි තොර කරගැනීම් සම්බන්ධ වාර්තාකරණයන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම, අනෙක් මාධ්‍යයන් තුළද නිත්‍ය භාවිතාවක් බවට පත් වනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**#MediaEthicsSL #lka #sinhalanews #TheMorning**